# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
# ආරක්ෂක අමාත්‍යාංශය

# ඇබෑර්තු

## AIIB මගින් අරමුදල් සපයනු ලබන 'ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)'

ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකුව (AIIB) අරමුදල් සපයනු ලබන 'ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයාමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ (RLVMMP)' ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) සඳහා පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වේ. බදුල්ල, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි නායයෑම් අවම කිරීමේ කාර්යයන් (පිහිටි ස්ථාන) සහ දුම්රිය මාර්ගය ඔස්සේ අස්ථාවර ස්ථානයන්/ මෙම ව්‍යාපෘතිය යටතේ ලිහිල් කෙරෙනු ඇත.

අදියර I යටතේ උග්‍ර අවදානම් සහිත ස්ථාන 24 ක් ලිහිල්/ නිවැරදි කළ අතර ඉතිරි ස්ථාන අදියර II යටතේ ලිහිල්/ නිවැරදි කෙරෙනු ඇත.

## 1. අභ්‍යන්තර විගණක (PS 4 - තනතුරු 1 කි)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය සාර්ථකව නිමා කර තිබීම.

   -හෝ-

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්

   -හෝ-

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන සුදුසුකමක්

   සමග අදාළ ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 8 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

2. රජයේ ගණකාධිකරණ සේවයේ, III/II වන පංතියේ තනතුරක අඩුතරමින් වසර 8 ක පළපුරුද්ද සහිත III/II වන පංතියේ නිලධාරියකු වීම.

   විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති වල අභ්‍යන්තර විගණන පළපුරුද්ද ඇත්නම් වඩාත් මැනවි.

**පොදු කොන්දේසි**

බඳවා ගැනීම මූලිකව කොන්ත්‍රාත් පදනම මත එක් වසරක කාලයක් සඳහා වන අතර, ඉන් පසුව, සතුටුදායක කාර්‍ය සාධනයට යටත්ව වාර්ෂිකව අලුත්කළ හැකිය.

තනතුර සඳහා වැටුප් සහ අනෙකුත් කොන්දේසි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 පරිදි වේ.

සේව්‍යයා සේ.අ.අ. සහ සේ.භා.අ. (EPF හා ETF) දායකත්වය 12% ක් හා 3% ක් වන අතර, සේවකයාගේ සේ.අ.අ. දායකත්වය තම මාසික වැටුපින් 8% ක්වේ.

වයස් සීමාව අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 65 ක් විය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

යෝග්‍යතා පූර්ණ අයදුම්කරුවන්ට, තම සම්පූර්ණ ජීව දත්ත සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ඇමතුම් අංක සහිත අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග මෙ දැන්වීමේ දිනයේ සිට දින 10 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්කරන තනතුරේ නම ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කොට පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP),**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**
**දුරකථන : 0112-559869**